०४
चतुर्थः पाठः ।

# सर्वे भवन्तु सुखिनः ।

## क्रियापदपरिचयः । ०१

- **कथन, गमन, धावन, दर्शन, हसन** ආදි කායකීය හෝ අවස්ථා යමකින් ප්‍රකාශ වන්නේ ද ඒවා ක්‍රියා නම් වේ. **पठति, धावति, लिखति, हसतौ, पश्यतः, खादतु, चकार, अपचत्, गमिष्यति, चिन्तयामास** යනාදි ය ක්‍රියාවෝ ය.

- ක්‍රියාපදයන්ගේ මූලය වන්නේ ධාතුව යි. ක්‍රියාපද නිර්මාණය වන්නේ මෙම ධාතුන්ගෙනි. ඉහත ප්‍රත්‍යයගත ව ඇති ක්‍රියාපදයන්ගේ ධාතුන් වන්නේ, පිළිවෙළින් **पठ्, धाव्, लिख्, हस्, दृश्, खाद्, कृ, पच्, गम्, चिन्त्** ආදිය යි.

- පරස්මෛපද, ආත්මනේපද හා උභයපද වශයෙන් ධාතු වර්ගත්‍රයකි. කිසියම් ක්‍රියාවක ඵලය කර්තෘට නොව අනෙකකුට වේ නම් එකී ක්‍රියාවන්ගේ ධාතු පරස්මෛපද කොටසට ද, යම් ක්‍රියාවක ඵලය කර්තෘ වෙත ම ලැබේ නම් එම ක්‍රියාවන්ගේ ධාතු ආත්මනේපද කොටසට ද අයත් වේ. කිසියම් ක්‍රියාවක් මෙම දෙකෙහි ම වේ නම් එය උභයපද නම් වේ.

- **ति** යනු පරස්මෛපද ධාතුන් කෙරෙන් පර වර්තමානකාල ප්‍රථමපුරුෂ ඒකවචන ප්‍රත්‍යය යි.

**नयति हसति पठति**

- **ते** යනු ආත්මනේපද වර්තමානකාල ප්‍රථමපුරුෂ ඒකවචන ප්‍රත්‍යය යි.

**हसते नयते पठते**

- උභයපදී ධාතුන් කෙරෙන් මෙම ප්‍රත්‍යය දෙක ම යෙදේ.

- සංස්කෘත භාෂාවේ ධාතු හෙවත් ක්‍රියාමූල කොටස් දහයකි. ඒවා ''ගණ'' නාමයෙන් හඳුන්වති. ඒවාට විකරණ නම් වූ විශේෂ ප්‍රත්‍යය වර්ගයක් සම්බන්ධ වීමෙන් පද නිර්මාණය වේ.

- මෙසේ නිර්මාණය වන ක්‍රියාපද හෙවත් ආඛ්‍යාතපද ''ලකාර'' නම් වූ විභක්ති දහයකට අයත් වේ. එය ක්‍රියාපද පිළිබඳ භේද දහයකි. නාමපද විභක්තිවල වරනැගෙන්නේ යම් සේ ද මෙම ක්‍රියාපද ද දශලකාරයෙහි එසේ වරනැගේ.

- කර්තෘකාරක, කර්මකාරක හා භාවකාරක වශයෙන් කාරක තුනක් ද පවතී.

1. लट् - වර්තමාන කාලයෙහි වේ.
2. लिट् - පරෝක්ෂභූත අතීත කාලයෙහි වේ.
3. लुट् - අනද්‍යතන භවිෂ්‍ය අනාගත කාලයෙහි ය.
4. लृट् - සාමාන්‍ය භවිෂ්‍ය අනාගත කාලයෙහි ය.
5. लेट् - වේද විෂයෙහි පමණක් යෙදේ.
6. लोट् - ආඥා, ප්‍රාර්ථනා යනාදි අර්ථවල යෙදේ.
7. लङ् - අනද්‍යතන භූත අතීත අර්ථයෙහි යෙදේ.
8. लिङ् - විධි ලිඞ් - විධි අර්ථයෙහි යෙදේ.
9. लुङ् - සාමාන්‍ය භූත අතීත අර්ථයෙහි යෙදේ.
10. लृङ् - ක්‍රියාතිපත්ති ක්‍රියා දෙකක නොවීම් අර්ථවල යෙදේ.

මෙම දශලකාර නාමයන් මතක තබා ගැනීම සඳහා පහත ශ්ලෝකය පාඩම් කර ගන්න.

लट् वर्तमाने लेट् वेदे भूते लुङ् लङ् लिटस्तथा ।
विध्याशिषौ लिङ्लोटौ लुट् लृट् लृङ् च भविष्यतः ॥

සරල වාක්‍ය නිර්මාණයේ දී උක්තාඛ්‍යාත සම්බන්ධ වන ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| सः बालः | तौ बालौ | ते बालाः |
| सा | ते | ताः |
| तत् | ते | तानि |
| त्वम् | युवाम् | यूयम् |
| अहम् | आवाम् | वयम् |

+

| | | |
|---|---|---|
| पतति | पततः | पतन्ति |
| पतसि | पतथः | पतथ |
| पतामि | पतावः | पतामः |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## लट् , लृट् , लङ् , लोट् , लिङ् ලකාරයන්හි පරස්මෛපද ප්‍රත්‍යයමාලාව

### लट्

| | | |
|---|---|---|
| ति | तः | न्ति |
| सि | थः | थ |
| मि | वः | मः |

| | | |
|---|---|---|
| पठति | पठतः | पठन्ति |
| पठसि | पठथः | पठथ |
| पठामि | पठावः | पठामः |

### लृट्

ष्य
स्य

| | | |
|---|---|---|
| ष्यति | ष्यतः | ष्यन्ति |
| ष्यसि | ष्यथः | ष्यथ |
| ष्यामि | ष्यावः | ष्यामः |

| | | |
|---|---|---|
| पठिष्यति | पठिष्यतः | पठिष्यन्ति |
| पठिष्यसि | पठिष्यथः | पठिष्यथ |
| पठिष्यामि | पठिष्यावः | पठिष्यामः |

### लङ्

अ

| | | |
|---|---|---|
| त् | ताम् | न् |
| ः | तम् | त |
| अम् | व | म |

| | | |
|---|---|---|
| अपठत् | अपठताम् | अपठन् |
| अपठः | अपठतम् | अपठत |
| अपठम् | अपठाव | अपठाम |

### लोट्

| | | |
|---|---|---|
| तु | ताम् | अन्तु |
| – | तम् | त |
| आनि | आव | आम |

| | | |
|---|---|---|
| पठतु | पठताम् | पठन्तु |
| पठ | पठतम् | पठत |
| पठानि | पठाव | पठाम |

### लिङ्

| | | |
|---|---|---|
| ईत् | ईताम् | ईयुः |
| ईः | ईतम् | ईत |
| ईयम् | ईव | ईम |

| | | |
|---|---|---|
| पठेत् | पठेताम् | पठेयुः |
| पठेः | पठेतम् | पठेत |
| पठेयम् | पठेव | पठेम |

ක්‍රියාපද සාධනයේ දී මෙසේ ධාතුන්ගෙන් පර ව ति, तः ආදි ප්‍රත්‍යය යොදා ගැනේ. ධාතුන් ප්‍රත්‍යයගත වන්නේ පුරුෂ හා කාලවලට අදාළව ය. මෙසේ **प्रथम, मध्यम** හා **उत्तम** යනුවෙන් පුරුෂ තුනක් ද **एकवचन, द्विवचन** හා **बहुवचन** වශයෙන් වචන තුනක් ද සංස්කෘත භාෂාවේ පවතී. දශලකාරයන්ගේ එබඳු විභක්ති ප්‍රත්‍ය 180කි. මෙහි එන ක්‍රියාපද පාඩම්වල දී **लट् - लङ् - लिट् - लृट् - लोट्** යන ලකාරයන් කෙරෙහි පමණක් අවධානය යොමු කෙරේ.

| लकार | प्र.पु. एक. | प्र.पु. द्वि. | प्र.पु. बहु. | म.पु. एक. | म.पु. द्वि. | म.पु. बहु. | उ.पु. एक. | उ.पु. द्वि. | उ.पु. बहु. |
|---|---|---|---|---|---|---|---|---|---|
| लट् | ति | तः | न्ति | सि | थः | थ | मि | वः | मः |
| लृट् | ष्यति | ष्यतः | ष्यन्ति | ष्यसि | ष्यथः | ष्यथ | ष्यामि | ष्यावः | ष्यामः |
| लङ् | त् | ताम् | न् | : | तम् | त | अम् | व | म |
| लोट् | तु | ताम् | अन्तु | -[हि] | तम् | त | आनि | आव | आम |
| लिङ् | ईत् | ईताम् | ईयुः | ईः | ईतम् | ईत | ईयम् | ईव | ईम |

√पत्

| लकार | प्र.पु. एक. | प्र.पु. द्वि. | प्र.पु. बहु. | म.पु. एक. | म.पु. द्वि. | म.पु. बहु. | उ.पु. एक. | उ.पु. द्वि. | उ.पु. बहु. |
|---|---|---|---|---|---|---|---|---|---|
| लट् | पतति | पततः | पतन्ति | पतसि | पतथः | पतथ | पतामि | पतावः | पतामः |
| लृट् | पतिष्यति | पतिष्यतः | पतिष्यन्ति | पतिष्यसि | पतिष्यथः | पतिष्यथ | पतिष्यामि | पतिष्यावः | पतिष्यामः |
| लङ् | अपतत् | अपतताम् | अपतन् | अपतः | अपततम् | अपतत | अपतम् | अपताव | अपताम |
| लोट् | पततु | पतताम् | पतन्तु | पत | पततम् | पतत | पतानि | पताव | पताम |
| लिङ् | पतेत् | पतेताम् | पतेयुः | पतेः | पतेतम् | पतेत | पतेयम् | पतेव | पतेम |

**ක්‍රියාකාරකම 4.1**

01. පහත දැක්වෙන ක්‍රියාපද පරස්මෛපදයෙහි වරනගා ඇත. එය හොඳින් අධ්‍යයනය කරන්න.

| धातु | लट् | लृट् | लङ् | लोट् | विधिलिङ् |
|---|---|---|---|---|---|
| √भू | भवति | भविष्यति | अभवत् | भवतु | भवेत् |
| √वद् | वदति | वदिष्यति | अवदत् | वदतु | वदेत् |
| √धाव् | धावति | धाविष्यति | अधावत् | धावतु | धावेत् |
| √गम् | गच्छति | गमिष्यति | अगच्छत् | गच्छतु | गच्छेत् |
| √कृ | करोति | करिष्यति | अकरोत् | करोतु | कुर्यात् |
| √हस् | हसति | हसिष्यति | अहसत् | हसतु | हसेत् |
| √स्मृ | स्मरति | स्मरिष्यति | अस्मरत् | स्मरतु | स्मरेत् |
| √पा | पिबति | पास्यति | अपिबत् | पिबतु | पिबेत् |
| √स्था | तिष्ठति | स्थास्यति | अतिष्ठत् | तिष्ठतु | तिष्ठेत् |

**ක්‍රියාකාරකම 4.2**

01. ලට් ලකාර ක්‍රියාරූපවලින් හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचनम् | द्विवचनम् | बहुवचनम् | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | लिखति | | | ලියයි | | |
| मध्यमपुरुष | | लिखथः | | | දෙදෙනෙක් | |
| उत्तमपुरुष | | | लिखामः | | | ලියමු |

**ක්‍රියාකාරකම 4.3**

01. ලෘට් ලකාර ක්‍රියාරූපවලින් හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचनम् | द्विवचनम् | बहुवचनम् | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | लेखिष्यति | | | ලියන්නේ ය. | | |
| मध्यमपुरुष | | लेखिष्यथः | | | දෙදෙනෙක් | |
| उत्तमपुरुष | | | लेखिष्यामः | | | ලියන්නෙමු |

**ක්‍රියාකාරකම 4.4**

01. ලඞ් ලකාර ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचनम् | द्विवचनम् | बहुवचनम् | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | अलिखत् | | | ලියුවේ ය | | |
| मध्यमपुरुष | | अलिखतम् | | | දෙදෙනෙක් ලියුවෙහු | |
| उत्तमपुरुष | | | अलिखाम | | | ලියුවෙමු |

**ක්‍රියාකාරකම 4.5**

01. ලෝට් ලකාර ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचनम् | द्विवचनम् | बहुवचनम् | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | लिखतु | | | ලියාවා | | |
| मध्यमपुरुष | | लिखतम् | | | දෙදෙනෙක් ලියව් | |
| उत्तमपुरुष | | | लिखाम | | | ලියමෝවා |

වර්තමාන ක්‍රියාපදයන්ගේ අගට **स्म** ප්‍රත්‍යය සම්බන්ධ කිරීමෙන් අතීතකාලික ලඞ් ලකාරයෙන් සිදුවන කාර්යය ඉටු කොටගත හැකි ය. එසේ සකස් වූ පදයන්ගෙන් ලැබෙන්නේ අතීත කාලීක අර්ථයකි.

अधावत् = धावति + स्म
अहसत् = सति + स्म

बाला हसति स्म । — දැරිය සිනාසුණා ය.
माता वदति स्म । — මව පැවසුවා ය.
अक्ष्वः शीघ्रं धावति स्म । — අශ්වයා වේගයෙන් දිව්වේ ය.

**ක්‍රියාකාරකම 4.6**

01. පහත ක්‍රියාරූප භාවිත කරමින් වගුවේ හිස්තැන් පුරවන්න.

गच्छेः / अगच्छताम् / गच्छन्तु / गमिष्यति / गच्छेयम् / गमिष्यसि / अगच्छतम् / गच्छत / गच्छन्ति / गच्छाम / गमिष्यामि / अगच्छाव / गच्छथ / गच्छेताम् / गमिष्यामः / गच्छावः

| | लट् | लृट् | लङ् | लोट् | लिङ् |
|---|---|---|---|---|---|
| प्र.पु. एक. | गच्छति | | अगच्छत् | गच्छतु | गच्छेत् |
| प्र.पु. द्वि. | गच्छतः | गमिष्यतः | | गच्छताम् | |
| प्र.पु. बहु. | | गमिष्यन्ति | अगच्छन् | | गच्छेयुः |
| म.पु. एक. | गच्छसि | | अगच्छः | गच्छ | |
| म.पु. द्वि. | गच्छथः | गमिष्यथः | | गच्छतम् | गच्छेतम् |
| म.पु. बहु. | | गमिष्यथ | अगच्छत | | गच्छेत |
| उ.पु. एक. | गच्छामि | | अगच्छम् | गच्छानि | |
| उ.पु. द्वि. | | गमिष्यावः | | गच्छाव | गच्छेव |
| उ.पु. बहु. | गच्छामः | | अगच्छाम | | गच्छेम |

**ක්‍රියාකාරකම 4.7**

01. නිදසුන ඇසුරින් හිස්තැන් පුරවන්න.

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| නිදසුන | **वसति स्म = अवसत्** | **वसतः स्म = अवसतात्** | **वसन्ति स्म = अवसन्** |
| ०२. | पूजयति स्म = ……….. | ……… स्म = अपूजयतात् | पूजयन्ति स्म = ……….. |
| ०३. | …………= अरक्षत् | रक्षतः स्म =…………….. | …………= अरक्षन् |
| ०४. | …….. स्म = ………… | कृरुतः स्म = अकृरुताम् | कुर्वन्ति …… = अकृर्वन् |
| ०५. | ………… = अचरत् | चरतः स्म = …………… | ………… = ……..… |

**ක්‍රියාකාරකම 4.8**

01. සිංහලට පරිවර්තනය කරන්න.

०१. गच्छतः । ०२. गायावः । ०३. नमन्ति । ०४. वहामः । ०५. पठिष्यसि ।
०६. म्लायति । ०७. नयसि । ०८. जयामि । ०९. धावथः । १०. हरन्ति ।
११. नेष्यति । १२. भविष्यथ । १३. गमिष्यामि । १४. भजथ । १५. अतिष्ठम् ।
१६. क्रीडिष्यतः । १७. करिष्यामि । १८. अवन्दत् । १९. अखादन् । २०. वादयिष्यावः ।

**ක්‍රියාකාරකම 4.9**

01. සංස්කෘතයට පරිවර්තනය කරන්න.

01. කති. 02. (දෙදෙන) පාඩම් කරහු. 03. ගෙන යමි.
04. නාද කරහි. 05. උසුලමු. 06. දකියි.
07. (දෙදෙන) කථා කරත්. 08. කරමි. 09. (දෙදෙන) ලියමු.
10. හිඳියි. 11. වෙත්වා ! 12. ගියෙහු.
13. පාඩම් කෙරේවා ! 14. දිව්වෝ ය. 15. බිවූහ.
16. වැන්දෙහි. 17. කීවා ය. 18. බිරුවේ ය.
19. කීවෙමු. 20. යව.


ක්‍රියාකාරකම 4.10

01. හිස්තැනට සුදුසු ක්‍රියාපදය වරහන් තුළ ඇති නිර්දේශයන්ට අනුව සකසන්න.

०१. अश्वः शीघ्रं धावति। अहं शीघ्रं .......... । (लट् - उ. पु. एक.)
०२. नराः समुद्रतीरं गच्छन्ति। वयं समुद्रतीरं ......... । (लट् - उ. पु. बहु.)
०३. अहं संस्कृतं पठामि। त्वं संस्कृतं .......... । (लट् - म. पु. एक.)
०४. त्वं क्षीरं पास्यसि। अहं क्षीरं .......... । (लृट् - उ. पु. एक.)
०५. कर्मकाराः प्रातः उत्तिष्ठन्ति। यूयं प्रातः .......... । (लोट् - म. पु. बहु.)
०६. युवां दूरदर्शनं पश्यथः। आवां दूरदर्शनं .......... । (लट् - उ. पु. द्वि.)
०७. गुरवः आसनेषु उपविशन्तु। यूयम् आसनेषु .......... । (लोट् - म. पु. बहु.)
०८. यदा सूर्यः अस्तं याति। तदा अन्धकारं .......... । (लृट् - प्र. पु. एक.)
०९. यावद् मम मित्रं न आगच्छति। तावद् अहं भोजनं .......... । (लट् - उ. पु. एक.)
१०. अधिकारिणाः कार्यालयम् अगच्छन्। यूयं कार्यालयम् .......... । (लङ् - म. पु. बहु.)

## दुर्बुद्धिर्विनश्यति।


अस्ति मगधदेशे फुल्लोत्पलनाम सरः। तत्र संकटविकटौ हंसौ निवसतः। कम्बुग्रीवनामकः तयोर्मित्रम् एको कुर्मोऽपि तत्रैव प्रतिवसति स्म।



अथैकदा धीवराः तत्रागच्छन्। तेऽकथयन् - " वयं श्वः मत्स्यकूर्मादीन् मारयिष्यामः।" एतच्छ्रुत्वा कूर्मोऽवदत् - " मित्रे किं युवाभ्यां धीवराणां वार्ता श्रुता? अधुना किमहं करोमि ? हंसौ अवदताम् - " प्रातो यदुचितं तत्कर्त्तव्यम्।" कूर्मोऽवदत्- " मैवम्। तद्यथाऽहम् अन्यं ह्रदं गच्छामि तथा कुरुतम्।" हंसाववदताम् - " आवां किं करवाव ? कूर्मोऽवदत् - " अहं युवाभ्यां सह आकाशमार्गेणान्यत्र गन्तुमिच्छामि।

हंसौऽवदताम् - " अत्र को उपायः ?" कच्छपो वदति - " युवां काष्ठदण्डमेकं चञ्च्वा धारयताम्। अहं काष्ठदण्डमध्येऽलम्ब्य युवयोः पक्षबलेन सुखेन गमिष्यामि।" हंसौ अकथयताम् - " सम्भवति एष उपायः। किन्तु अत्रैकोपायोऽपि वर्तते। आवाभ्यां नीयमानं त्वामवलोक्य जनाः किञ्चिद् वदिष्यन्ति एव। यदि त्वमुत्तरं दास्यसि तदा तव मरणं निश्चितम्। अतः त्वमत्रैव वस।" तच्छ्रुत्वा क्रुद्धः कुर्मोऽवदत् - " किमहं मूर्खः ? उत्तरं न दास्यामि।" किञ्चिदपि न वदिष्यामि। अतोऽहं यथा वदामि तथा युवां कुरुतम्।

एवं काष्ठदण्डे लम्बमानं कूर्मं गोपालकोऽपश्यन्। पश्चाद् अधावन् अवदन्। च - " हंहो महदाश्चर्यम्। हंसाभ्यां सह कूर्मोऽपि उड्डीयते।" कश्चिद् वदति- " यद्ययं कूर्मः कथमपि निपतति तदा अत्रैव पक्त्वा खादिष्यामि।" अपरोऽवदत्- "सरस्तीरे दग्ध्वा खादिष्यामि।" अन्योऽकथयत् -



" गृहं नीत्वा भक्षयिष्यामि " इति। तेषां तद् वचनं श्रुत्वा कूर्मः क्रुद्धो जातः। मित्राभ्यां दत्तं वचनं विस्मृत्य सोऽवदत् - " यूयं भस्म खादत।" तत्क्षणमेव कूर्मो दण्डाद् भूमौ पतितः। गोपालकैः स मारितः। अत एवोक्तम्-

सुहृदां हितकामानां वाक्यं यो नाभिनन्दति।
स कूर्म इव दुर्बुद्धिः काष्ठाद् भ्रष्टो विनश्यति॥

01. ඉහත කථාව හඬනගා සාවධාන ව කියවන්න. ඔබ මෙතෙක් උගත් ආඛ්‍යාත පද යෙදී ඇති අයුරු අවබෝධ කොට ගන්න.
02. කථාවේ ඇතුළත් වර්ණ ගන්වන ලද ක්‍රියාපදවල ලකාරය, පුරුෂය, වචනය හා තේරුම ලියන්න.

उदाहरणानि-

| क्रियापदानि | लकाराः | पुरुषाः | वचनानि | अर्थाः |
|---|---|---|---|---|
| निवसतः | लट् | ප්‍රථමපුරුෂය | ද්විවචන | දෙදෙන වාසය කරත්. |
| अगच्छन् | लङ् | ප්‍රථමපුරුෂය | බහුවචන | ගියහ. |

गुणिनि गुणज्ञो रमते।

ගුණය දන්නා වූ තැනැත්තා ගුණවතා කෙරෙහි ඇලේ.

ज्ञानमार्गे ह्यहंकारः परिघो दुरतिक्रमः।

උඩඟුකම ඥාන මාර්ගයෙහි බලවත් බාධකයකි.

दर्दुरा यत्र वक्तारस्तत्र मौनं हि शोभनम्।

යම් තැනක මැඩියෝ කථාකරත් ද එහි නිහඬවීම යහපත් වේ.